# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 59 දරන
# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 දෙසැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 දෙසැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 59 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 දෙසැම්බර් මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 56/93

**1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1993 අංක 59 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ 22අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— 1979 අංක 23 දරන පනතේ 22අ වගන්තිය ඇතුළත් කිරීම.

"අමාත්‍යවරයා සතු විශේෂ බලය.

22අ. කිසියම් විශේෂ ප්‍රදේශයක් තුළ හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් බලතල, එනම්:—

(අ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 20 වන වගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයෙන් අමාත්‍යවරයකු වෙත පැවරී ඇති බලතල;

(ආ) රජයේ ඉඩම් ආඥාපනතේ 49 වන, 51 වන, 79 වන සහ 80 වන වගන්ති මගින් අමාත්‍යවරයකු වෙත පැවරී ඇති බලතල;

(ඇ) රජයේ ඉඩම් පිළිබඳ විශේෂ ප්‍රදාන සහ බදු දීම් සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥාපනතේ යම් විධිවිධානයක් මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් මගින් අමාත්‍යවරයකු වෙත පැවරී ඇති බලතල

ඒ වගන්තියේ, විධිවිධානයේ නියමයේ හෝ නියෝගයේ "අමාත්‍යවරයා" පිළිබඳව ඇති සඳහන, මේ පනතේ පරිපාලනය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා පිළිබඳ සඳහනක් වූවාක් ලෙස, මේ පනතේ පරිපාලනය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින්, ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේය; තව ද මේ වගන්තිය, බලාත්මකව පවත්නා තාක් කල් සහ ඒ තාක් කල් පමණක්, මේ පනතේ පරිපාලනය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා හැර, වෙනත් කිසිම අමාත්‍යවරයකු විසින් එවැනි යම් බලයක් විශේෂ ප්‍රදේශයක් තුළ හෝ ඒ ප්‍රදේශයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොකළ යුතු ය.".

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මැ 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.